www.tamilarangam.net

# යාපනය විශ්ව විද්‍යාලයේ සිසු නායක ටී. විමලේස්වරන්

# කොටින් විසින් අමානුෂික ලෙස මරා දමයි!

යාපනය විශ්ව විද්‍යාලයේ සිසු නායකයෙකු වූද, සිසුන්ගේ හා පීඩිත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් පිළිබඳ සටන් වල ප්‍රමුඛ පෙළේ පුද්ගලයෙකු වූද, කම්කරු පන්ති මතවාදයෙන් හසුරුවන ලද මාක්ස්වාදියෙකු වූ දෙමළ ජනතාවගේ විමුක්ති අරගලයේ ප්‍රමුඛ සටන්කාමියෙකු වූ ටී. විමලේස්වරන් (අවු. 25 යි.) -(වාණිජ්‍යය පීඨය) පසුගිය ජූලි 18 බ්‍රහස්පතින්දා දහවල් යාපනය විශ්ව විද්‍යාලයේ සිට තම නිවස කරා යමින් සිටියදී, යාපනයේ නල්ලූර් සට්ටනාදර් කොවිලඩි නම් ස්ථානයේදී මිනීමරු කොටින් විසින් ඉතා කෲර සහගත ලෙස මරාදමා ඇති බව දැඩි සංවේගයකින් යුතුව අප දෙමළ කථා කරන ජනතාව වෙත දැනුම් දෙමු.

1963 දී කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පුනකරි නම් ග්‍රාමයේ ගොවි පවුලක උපත ලැබූ ටී. විමලේස්වරන් 1982 වර්ෂයේදී යාපනය විශ්ව විද්‍යාලයේ වාණිජ්‍යය පීඨයට තේරී පත් විය. ඔහු දෙවන වසර අධ්‍යාපනයෙහි නිරතව සිටියදී 1984 දී දෙමළ ඊලාම් මහජන විමුක්ති සංවිධානයේ (ප්ලොට්) සාමාජිකයෙකු බවට පත්විය. පසුව විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු තාවකාලිකව නතර කළ ඔහු ප්ලොට් සංවිධානයේ සාමාජිකයන් සමඟ එකතුවී වතුකරයෙන් කිලිනොච්චියට අනාථයන් ලෙස සංක්‍රමණික වූ පුද්ගලයින් පුනරුත්ථාපන කටයුතු වල නිරත විය. ඔහු වසර දෙකක් පමණ එබඳු ව්‍යාපෘතියක වැඩ කරමින්, අනාථ වූ අයගේ සුභසාධනය සඳහා නිරත විය.

ඉන්පසු 1986 දී ප්ලොට් සංවිධානයේ මතවාදය හා ඔහු දැරූ මතවාදය අතර වූ ඝට්ටනය සහ එම සංවිධානයේ අභ්‍යන්තරයේ තිබූ අරාජික තත්ත්වය නිසා අතරමැද නවතා තිබූ විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු වල යළි නිරත විය. එම කාලය තුළදී ම , විශ්ව විද්‍යාලයෙහි හටගත් ශිෂ්‍ය සටන් වලද ඔහු නිරත විය. විශ්ව විද්‍යාල ශිෂ්‍ය සභා මගින් සංවිධානය කළ සිරභාරයේ රඳවා ඇති සිරකරුවන් නිදහස් කර ගැනීමට කළ උපවාසයට ද ඔහු සහභාගී විය. ඒ සමඟම විශ්ව විද්‍යාල සංස්කෘතික කණ්ඩායම මගින් වේදිකාගත කළ දෙමළ ජාතික විමුක්ති අරගලය ගැන කියැවෙන ," මන් සුමන්ද මේනියර් ll " නම් නාට්‍යයෙහි ප්‍රධාන චරිතයක් ද රඟපෑවේ ය. මේ සමඟම 1986 වර්ෂයේ මැද භාගයේදී නව ශිෂ්‍ය සංවිධාන කමිටුවට සාමාජිකයන් තේරූ අවස්ථාවේදී එහි ක්‍රියාකාරී කමිටුවේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකත්වයට ශිෂ්‍යයන් අතරින් තේරී පත්විය. ශිෂ්‍යයන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් දිනා ගැනීමේ සටන් වල ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේය.

1986 ඔක්තෝබර් මස 04 වන දින, විශ්ව විද්‍යාලයේ වාණිජ්‍යය පීඨයේ ශිෂ්‍යයෙකු වූ ඒ. විජිදරන් කොටින් විසින් පැහැර ගෙන ගොස් මරා දැමූ අවස්ථාවේ විශ්ව විද්‍යාලයීය සිසුන් මාසයක් පමණ කාලයක් එයට විරුද්ධව අවිහිංසාවාදී අරගලයක් ගෙනගියේය. විශ්ව විද්‍යාලීය අවසන් වසර විභාගයට පෙනී සිටීමට ආසන්නව තිබියදී ඒ ගැන ද නොතකා මෙම සටනේදී ඔහු එයට නායකත්වය දුන්නා පමණක් නොව, එකී සටනේ තීව්‍ර අවස්ථාව වූ මාරාන්තික උපවාසයට ද ඔහු සහභාගි වී දින 10 ක් පමණ රැඳී සිටියේය. මෙහිදී කොටින් හා අනෙකුත් දෙමළ විමුක්ති සංවිධාන සිසුන්ට හා ජනතාවට ප්‍රසිද්ධියේ දුන් පොරොන්දු හේතු කොටගෙන මෙම උපවාසය අතරමඟදී නතර කළේය.

එසේ නමුදු උපවාසය නතරවී මාසයක් ගතවීමට මත්තෙන් කොටින් ඔවුන්ගේ පොරොන්දු කඩ කරන ලදී. තමන්ට එරෙහිව සටන් කිරීමට නායකත්වය දුන් හේතුව මත කොටින්ගේ අවධාරණයට හා විමසිල්ලට ඔහුව ලක් විය. එනමුදු කොටින්ගේ උත්සාහය සඵල නොවිය. විමලේස්වරන් විසින් විශ්වාසය තැබූ ජනතාව, ඔහුව අත් නොහැරියේය. යාපනය අර්ධද්වීපයේ කුල වශයෙන් පීඩනයට පත් පසුගාමී දුප්පත් කුලී ගොවියන් ජීවත්වන ග්‍රාමයක ජනතාව ඔහුව ආරක්ෂා කරන ලදී. විමලේස්වරන් කෙරේ මෙම ජනතාවගේ පැහැදීම කොතරම් වූවාද යත්, ඔවුන් විසින් හදා-වඩා ගත් දරුවෙකුට සේම ඔහුට සලකන ලදී. මෙම කාලය තුළදී ඔහු තම වටිනා කාලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම උත්සාහ දැරීය. මෙකී කාලයේ එම ග්‍රාමයේ ජනයා ඒකරාශී කොට, සංවිධානය කිරීමේ කටයුතු වල සහ එම ජනතාවගේ බුද්ධිමට්ටම නඟා සිටුවීමේ කටයුත්තට වැඩි අවධානයක් යොමු කරන ලදී. එම ග්‍රාමයේ පුස්තකාලයක්, අධ්‍යාපනික ආයතනයක් පිහිටුවූ ඔහු, කුඩා ළමුන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කිරීමට නිදි නොලබා නිරත විය.

தமிழ்த் தேசிய ஆவணச் சுவடிகள்

www.tamilarangam.net


–දිවා කාලයේ ග්‍රාමයේ ජනතාව සමග ඔවුන්ගේ වැඩකටයුතු වල නිරත වෙමින්, මොහු ගැමි ජනතාවගේ දුක් වේදනා සමසේ බෙදා ගත්තේ ය.

1987 තේ මැද භාගයේදී කොටින් සමග ඔවුන් දිගින් දිගටම පවත්වන වලට මැදිවූ සරසවි සිසුන් කොටින් සමග සාමකාමී තත්ත්වයක් ගොඩනගා ගැනීම සඳහා සාකච්ඡාවකට පැමිණෙන ලදී. මෙහිදී සාමකාමී වාතාවරණය ඇති කිරීම සඳහා පූර්ව කොන්දේසියක් වශයෙන් විමලේස්වරන්ට නැවත තම අධ්‍යාපන කටයුතු වල නිරතවීමට අවස්ථාව ලබාදෙන ලෙස ශිෂ්‍ය නියෝජිතයන් විසින් කොටින්ගෙන් ඉල්ලා සිටින ලදී. මෙහිදී කොටින් වෙනුවෙන් ඔවුන්ගේ උපනායක "මහත්තයා " නැමැත්තා විමලේස්වරන්ට තම අධ්‍යාපන කටයුතු නැවත කරගෙන යන ලෙස ඉඩ ලබාදෙන බවට හා එහිදී මැදිහත් නොවන බවට පොරොන්දු විය. මෙම පොරොන්දුව මත, විශ්වාසය තබමින් සිසුන් විසින් විමලේස්වරන්ව නැවත අධ්‍යාපනයේ නිරත කරවීම සඳහා පොළඹවන ලදී.

සිසු නායක විමලේස්වරන් තම අධ්‍යාපන කටයුතු යළි ඇරඹීමට බලාපොරොත්තුව සිටියදී 1987 ඔක්තෝබර් මාසයේදී කොටි හා ඉන්දිය හමුදාව අතර, යුද්ධය ඇරඹිනි. මෙම යුද්ධය ආරම්භ වී, මෙම යුද්ධය මගින් යාපන අර්ධද්වීපයෙහි ජනතාව ඉතා දුක්ඛිත තත්ත්වයකට පත් කරන අවස්ථාවේදී, ඔහු විසින් එම ජනතාව එකී තත්ත්වයෙන් මුදා ගැනීමේ කටයුත්තේ හා නඩත්තු කිරීමේ කටයුතු වල නිරත වෙමින් ග්‍රාමීය ජනතාවගේ සුභසාධනය සඳහා තම අවධාරණය යොමු කරන ලදී. එම ග්‍රාමයේ හා අනෙකුත් එවැනි ග්‍රාමයන්හි ජනතාව එක්තැන් කොට තවත් එවැනිම තරුණ කොටස් සමග එකතු වී අනාථ කඳවුරක් පිහිටුවා මාසයකට වැඩි කාලයක් එය නඩත්තු කරන ලදී.

යුද තත්ත්වය තරමක් සමනය වූ අවස්ථාවේදී 1988 අප්‍රේල් මස පවත්වන ලදී විශ්ව විද්‍යාල අවසන් වසර විභාගයට පෙනී සිට එහි ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටියේය. කොටින් විසින් සරසවි සිසුන්ට දුන් පොරොන්දුව මත විශ්වාසය තබා තමන්ට අනතුරක් නැතැයි යන බලාපොරොත්තුව ඇතිව ඔහු පුද්ගලික අධ්‍යාපනික ආයතන කීපයක ඉගැන්වීමේ නිරත විය. නුමුත් මිනීමරු කොටින් විසින් ඔවුන්ගේ පොරොන්දුවට පිටින් යමින්, වසර දෙකකට කලින් තමන්ට විරුද්ධව තිබූ ප්‍රජාතන්ත්‍රවාදී සටනට නායකත්වය දුන් හේතුව මත ඊට පළි ගැනීමක් වශයෙන් විමලේස්වරන්ව මහ පාරේදී අමානුෂික ලෙස මරා දමා ඇත.

ආදරණීය දෙමළ කථා කරන ජනතාවනි!

ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කළාවූද, ජනතාව වෙනුවෙන් පෙනී සිටියාවූද, ශ්‍රේෂ්ඨ සටන්කාමියෙකු වූ ටී. විමලේස්වරන් මරා දමා ඉවරයි! මෙවැනි අමානුෂික ඝාතන ඔබ තවදුරටත් අනුමත කරනවාද? ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් දිගින් දිගටම උදුරා ගැනීම ඉදිරියේ නිහඬව බලා සිටිනවාද?

**ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම සඳහා අරාජිකත්වය පරාජය කරමු!**

**යාපනය විශ්ව විද්‍යාල සිසුන්.**

தமிழ்த் தேசிய ஆவணச் சுவடிகள்